# අධ්‍යාපන , උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

**NAITA**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**මෙම අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ**

# සහකාර අධ්‍යක්ෂ
# (සැළසුම් හා සංවර්ධන තනතුර)

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම් කරුවන් සඳහා** (පහත 01 හෝ 02 හෝ 03 හෝ 04)

01.විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු / තාක්ෂණ/ විද්‍යා /ගණිත / කෘෂිකර්ම/කළමනාකරණ/ සමාජ විද්‍යාව/ අධ්‍යාපන / වානිජ උපාධියක් ලබා තිබීම **සමග** රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක /ආයතනයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක ප්‍රථම උපාධියෙන් පසු අදාල ක්ෂේත්‍රයේ වසර 03 ක කණිෂ්ඨ කළමනාකරණ මට්ටමෙහි පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

02.ඉංජිනේරු සභාවේ (CEI) පැරණි විෂය නිර්දේශය 2 වන අදියර, නව විෂය නිර්දේශය 3 වන අදියර / ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පැරණි විෂය නිර්දේශය 2 වන අදියර , නව විෂය නිර්දේශය 3 වන අදියර සමත්වීම **සමග** රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක /මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 03 ක කණිෂ්ඨ කළමනාකරණ මට්ටමෙහි පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

03.තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් 07 වන මට්ටමට නොඅඩු සහතිකයක් **සමග** රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක /මණ්ඩලයක /ආයතනයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 03 ක කණිෂ්ඨ කළමනාකරණ මට්ටමෙහි පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

04.පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයක ඉංජිනේරු ඩිප්ලෝමාවක් (ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව -NDT ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව - NDES/ උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව -HNDE/ තාක්ෂණ ඩිප්ලෝමාව-D.Tech) **හෝ** තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගත් අදාල ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 06 වන මට්ටමට නොඅඩු සහතිකයක් **සමග** රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක /මණ්ඩලයක /ආයතනයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක වසර 06 ක කණිෂ්ඨ කළමනාකරණ මට්ටමෙහි පළපුරුද්දක් ඇතුළුව අදාල ක්ෂේත්‍රයේ වසර 12 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම් කරුවන් සඳහා** (පහත 01 හෝ 02)

01. ඉහත බාහිර අයදුම් කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

02. කණිෂ්ඨ කළමනාකරණ මට්ටමෙහි (JM 1-1) තනතුරක අදාල ක්ෂේත්‍රයේ වසර පහක (05) ක සතුටුදායක සේවය

**වැටුප් පරිමාණය : රු. 91,690 - 10 x 2,480 - 15 x 3,450 - 168,240 (MM 1-1)**

**වැටුප් පියවර : රු. 81,710/-** ( කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව )

(රජයේ අනුමත දීමනා + භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව සන්නිවේදන දීමනා සඳහා හිමිකම් ලබයි)

**වයස් සීමාවන්** : වයස අවුරුදු 22 - 45 අතර විය යුතුය

**(අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ)**

**පොදු උපදෙස්**

- **නියමිත ආකෘති පත්‍ර වල සකසන ලද අයදුම්පත් අයදුම්පත් 2026 අප්‍රේල් මස 23 දින හෝ ඊට පෙර සභාපති, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, 971, ශ්‍රී ජයවර්ධන පුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අදාළ අයදුම් පත්‍රයේ ආකෘතිය ජාතික ආධුනිකකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ නිල වෙබ් අඩවිය වන https://www.naita.gov.lk වෙතින් බාගත කර ගත හැක.**
- **ඉල්ලුම් කරන තනතුර අයදුම්පත බහාලු ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සදහන් කළ යුතුය**
- **රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් හරහා යොමු කළ යුතු අතර, ඔවුන් තෝරාගනු ලැබුවහොත් , පත්වීම ලබා ගැනීම සදහා අයදුම්කරු නිදහස් කළ හැකිද යන්න සහතික කළ යුතුය.**



**www.naita.gov.lk**

සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
නො 971 , ශ්‍රී ජයවර්ධන පුර මාවත,
වැළිකඩ ,රාජගිරිය
දුරකථන 011 2888782 -5